

# නාවික හමුදාව පිටබැද්දර පාලමේ සිරවූ අපද්‍රව්‍ය ඉවත් කරමින්

නාවික හමුදාව විසින් මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස, පිටබැද්දර පාලමේ සිරවී ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මෙහෙයුම්වල නිරත වී සිටිති. මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර සහ සියඹලාගොඩ රොටුඹ, පස්ගොඩ යා කරන පිටබැද්දර පාලමේ යට කොටස, පැවති ගංවතුර තත්ත්වය හේතුවෙන් මේ වන විට විශාල වශයෙන් අපද්‍රව්‍ය සහ දැව කඳන් සිරවී ජලය බැස යෑමට නොහැකි තත්ත්වයට පත් වී ඇත.

එම හේතුව නිසා පෙරේදා (28 දා) රාත්‍රී වන විට නිල්වලා ගඟේ ජල මට්ටම ඉහළ යෑම හේතුවෙන් අකුරැස්ස අවට ප්‍රදේශයට තවදුරටත් ජල ගැලීමේ අවදානමක් පැවතිණි.

මෙම අවදානම් තත්ත්වය සැළකූ විගස ශ්‍රී ලංකා නාවික හමුදා විශේෂ යාත්‍රා බලඝණයට සහ මැරීන් බලකායට අනුයුක්ත නාවික පුද්ගලයන් 71 දෙනෙකුද කිම්දුම් අංශයේ නාවිකයන් 6 දෙනෙකුද එම ස්ථානය වෙත කඩිනමින් පිටත්කර යැවීමට නාවික හමුදාව විසින් කටයුතු කරනු ලැබීය.

ගාල්ල - ලලිත් චාමින්ද සහ එස්. කේ. කළුආරච්චි